**තේ පර්යේෂණ මණ්ඩලය - 2013**

තේ පර්යේෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 15 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 දරන 38 මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං රා ගි ප්‍ර)**

(අ) ශ්‍රී. ලං. රා. ගි. ප්‍ර - 07

(i) ඉඩම් හා ගොඩනැගිලි වෙන් කර දැක්විය හැකි වත්කම් වන අතර වෙනම ගිණුම් ගත කළ හැකි වුවත්, රු.මිලියන 201.14 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි වෙනම දක්වනු වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල එකතු කර දක්වා තිබුණි.

(ii) රු.මිලියන 158.20 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රමිතියට අනුකූල වන පරිදි ලෙජර ගිණුම්වල වර්ගීකරණය කර නොතිබුණි.එම ස්ථාවර වත්කම්වල වටිනාකම දීර්ඝ කාලයක් ඉදිරියට ගෙනවිත් තිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය.මණ්ඩලයේ රසායනික රසායනාගාරයේ රු.662,077 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම එවැනි රසායනික රසායනාගාරයක් කොළඹ පිහිටා නොතිබූ බැවින් භෞතිකව හඳුනාගත නොහැකි විය.

තවද ආයතනයේ සභාපති විසින් මෙම ආයතනය වර්ෂ 75 කට වැඩි කාලයක් පැරණි ආයතනයක් වන හෙයින් එහි වත්කම් ඉතා පැරණි බවත් ප්‍රධාන කාර්යාලයේ, තලවාකැලේ, උප මධ්‍යස්ථාන 5 ක, වතු දෙකක හා තවත් බොහෝ සේවක බංගලාවල ඒවා පවතින බවත් එම වත්කම්වලින් වැඩි ප්‍රමාණයක් සම්පූර්ණයෙන් ක්ෂය කර ගිණුම්වල ශුන්‍ය, අගයක් දැක්වෙන බවත්, ශුන්‍ය අගයට ක්ෂය වී ඇති වත්කම් හඳුනාගෙන ඇති බවත්, ප්‍රත්‍යාගණනය තක්සේරු දෙපාර්තමේන්තුව යටතේ කෙරෙන බවත් එය බොහෝ දුරට නිම වී ඇති බවත් 2014 සැප්තැම්බර් 01 දින මා වෙත දන්වා තිබුණි.

(ආ) ශ්‍රී.ලං. රා.ගි.ප්‍ර - 09

ඉන්වෙන්ට්‍රි ශුද්ධ උපලබ්ධි අගයට ලියාහරින නමුත් රු.302,893 ක් පිරිවැය වූ පාවිච්චි කළ නොහැකි විද්‍යාත්මක තේ පර්යේෂණ තොගයක් එම තොගයේ ශුද්ධ උපලබ්ධි වටිනාකම තීරණය කිරීමෙන් තොරව 2005 වර්ෂයේ සිට පොත්වල දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සංවර්ධන වියදම් පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ .

(අ) මණ්ඩලයේ පහතරට ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය භාර නිලධාරිට හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට කුඩා තේ වතු අංශ ව්‍යාපෘතියේ තේ අස්වනු යාන්ත්‍රණය යටතේ පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා රු.800,000 ක් හා රු.1,000,000 ක් වූ අත්තිකාරම් ගෙවා තිබුණි.කෙසේ වුවද මෙම කාර්යය ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බැවින් මෙම මුදල් කෙරීගෙන යන ව්‍යාපෘති අත්තිකාරම්වලට හර කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ගිණුමට සම්පූර්ණයෙන් හර කර තිබුණි.

(ආ) 1979 සිට 1982 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ තේ සකස් කිරීම පිළිබඳ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා රු.4,142,173 ක මුදලක් 1982 වර්ෂයේ සිට කෙරීගෙන යන වැඩවල දක්වා තිබුණද, ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා එම දිනයන් තුළ මිලදීගත් යන්ත්‍රෝපකරණ සුදුසු නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගිණුම්වල ගැලපීම් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් හා ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුදල් ලෙස පිළිවෙලින් රු.30,459 ක් හා රු.1,972,668 ක් දක්වා තිබුණද, එම මුදල් මණ්ඩලයට ගෙවිය යුතු මුදල් ලෙස අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලයට අදාළ රු.232,386 ක් වූ විවිධ ණයගැතියන් වර්ෂ දෙකකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ආ) ශාන්ත කුම්බ්ස් වතුයායේ වර්ෂ පහකට වැඩි කාලයක් හිඟ හිට පැවති එකතුව රු.697,663 ක් වූ ණයගැති ශේෂයන් අයකර ගැනීමට වර්ෂ 5 කට වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි.

**2.2.6 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 177 (1) හා (3) | ශාන්ත කුම්බිස් කර්මාන්තශාලාව හා ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාව විසින් සමාලෝචිත වර්ෂය තුළ කරන ලද පිළිවෙලින් රු.3,616,770 ක් හා රු.1,538,515 ක් වූ දෛනික මුදල් එකතු කිරීම් දෛනිකව හෝ හැකි ඉක්මණින් බැංකු ගත කර නොතිබුණු අතර සමහර මුදල් එකතු කිරීම් එදිනෙදා වියදම් සඳහා උපයෝජනය කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | (i) රු.280,198 ක් වූ අත්තිකාරම් එම අත්තිකාරම් දීමේ අරමුණ සම්පූර්ණ කරගෙන මාස තුනකට වැඩි කාලයක් ප්‍රමාද කිරීමෙන් පසුව නිරවුල් කර තිබුණි.<br>(ii) ශාන්ත කුම්බිස් කර්මාන්තශාලාව විසින් දෙන ලද රු.15,267 ක් වූ මුදල් අත්තිකාරම් වර්ෂ 5 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 23.42 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 28.68 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 5.26 ක වර්ධනයක් දැක්වුණි.රු.මිලියන 18.66 කින් වෙනත් ආදායම වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද, වතු දෙකෙහි ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 8.41 කින් අඩු වී තිබුණි.

### 3.2 මෙහෙයුම් සමාලෝචනය

#### 3.2.1 වතුයායන්හි මෙහෙයුම් ප්‍රතිඵල

කර්මාන්තශාලා දෙකක් ඇතුළත්ව මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ශාන්ත කූම්බ්ස් වතුයාය හා ශාන්ත ජෝකිම් වතුයාය යන වතුයායන් දෙකෙහි සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵල පහත දැක්වේ.

| | ශාන්ත කූම්බ්ස් වතුයාය | | ශාන්ත ජෝකිම් වතුයාය | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **තේ විකුණුම්** | | | | |
| විකුණුම් වටිනාකම | 183,877 | 173,875 | 138,729 | 111,773 |
| වෙනත් ආදායම | 2,103 | 2,356 | 19,557 | 15,524 |
| මුළු ආදායම | 185,980 | 176,231 | 158,286 | 127,297 |
| අඩුකළා | | | | |
| මුළු වියදම | (179,510) | (153,263) | (159,177) | (135,021) |
| මෙහෙයුම් ලාභය/( පාඩුව) | 6,470 | 22,968 | (891) | (7,724) |
| පෙර වර්ෂයේ ගැලපීම් | (32) | (335) | (187) | (1,141) |
| ශුද්ධ ලාභය / (පාඩුව) (රු.000) | 6,438 | 22,633 | (1,078) | (8,865) |
| විකුණුම් (කිලෝග්‍රෑම්) | 374,098 | 376,712 | 297,899 | 283,065 |
| තේ කිලෝග්‍රෑම් එකකට නිෂ්පාදන පිරිවැය (රු) | 473.21 | 411.49 | 455.89 | 405.25 |
| හෙක්ටයාර් එකකට ඵලදාව (කිලෝග්‍රෑම්) | 2,400 | 2,293 | 1,746 | 774 |
| ශුද්ධ විකුණුම් සාමාන්‍යය (කිලෝග්‍රෑම් එකකට රු.1) | 485.05 | 455.29 | 458.62 | 388.37 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශාන්ත කූම්බ්ස් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 2,614 කින් අඩු වී තිබුණ ද විකුණුම් වටිනාකම රු.මිලියන 10 කින් වැඩිවී තිබුණි. කෙසේවුවද මෙහෙයුම් ලාභය රු.මිලියන 16.5 කින් අඩු වී තිබුණි.

(ආ) කිලෝග්‍රෑම් 14,834 කින් තේ විකුණුම් ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශාන්ත ජෝකිම් වතුයායේ මෙහෙයුම් පාඩුව රු.මිලියන 6.8 කින් අඩු වී තිබුණි.

(ඇ) ශාන්ත ජෝකිම් වතුයායේ ගිණුම්වලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්තශාලාවෙන් රු.මිලියන 1.49 ක ලාභයක් උපයා තිබූ බවත්, රු.මිලියන 4.9 ක පාඩුව තේ වතුයායෙන් සිදු වී තිබූ බවත් නිරීක්ෂණය විය. තේ පොතට අනුව සමාලෝචිත වර්ෂය තුළ අමු තේ දළු කිලෝග්‍රෑම් 211,045 ක් වතුයායෙන් ලබා ගෙන තිබූ අතර අමු තේ දළු සපයන්නන්ගෙන් කිලෝග්‍රෑම් 1,200,527 ක් මිලදී ගෙන තිබුණි.වතුයායේ හිඩැස් භූමි ප්‍රදේශ පිරවීමේ කාර්යයන් අඛණ්ඩව සිදු කළේ නම් සරු ඵලදාවක් ලබාගත හැකිව තිබුණු බවද තවදුරටත් නිරීක්ෂණය විය. විගණනයට ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට හිස් වූ පැල ප්‍රමාණය 329,796 ක් විය. රබර් වගාවෙන් රු.මිලියන 1.3 ක ලාභයක් අත්කර ගෙන තිබුණද, කුඹුරු ඉඩම් හෙක්ටයාර් 8.74 ක් වගා කරන ලද බදු වගා කරුවන් 35 දෙනෙකුගෙන් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

(ඇ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, කර්මාන්තශාලා දෙකෙහි යන්ත්‍රවල තේ නිෂ්පාදන ධාරිතාවය දිනකට කිලෝග්‍රෑම් 10,000 ක් හා කිලෝග්‍රෑම් 15,810 ක් විය. කෙසේ වුවද යන්ත්‍රවල තථ්‍ය සාමාන්‍ය උපයෝජනය පිළිවෙලින් දිනකට කිලෝග්‍රෑම් 4,630 ක් (සියයට 46.3 ක්) හා කිලෝග්‍රෑම් 3,870 ක් (සියයට 24 ක්) වූ බව නිරීක්ෂණය විය.

## 4. කාර්යසාධන සමාලෝචනය

### 4.1 පර්යේෂණ කටයුතු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ලබා ගත හැකි වූ ප්‍රගති වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් පිළිබඳ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | වැඩ සටහන | වෙන්කරන ලද මුදල | | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන |
| | | රු.මිලියන | රු.මිලියන | | |
| i | ඵලදාව වැඩිදියුණු කිරීම | 11.50 | 12.89 | 64.70 | 96.97 |
| ii | ඉඩම් ඵලදායීතාවය වැඩිදියුණු කිරීම. | 8.81 | 21.86 | 71.96 | 106.31 |
| iii | දේශගුණික වෙනස්වීම් බලපෑම, භාවිතය, අවම කිරීම් උපාය මාර්ග | 1.54 | 2.11 | 77.92 | 101.90 |
| iv | ක්ෂේත්‍ර පරිචයන් පිළිබඳ යාන්ත්‍රණය | 0.03 | 1.84 | 33.33 | 135.33 |
| v | තවාන් කළමනාකරණ ශිල්පීය ක්‍රම | 0.52 | 0.98 | 90.38 | 185.71 |
| vi | ඵලදාව කළමනාකරණය | 5.67 | 11.77 | 53.26 | 91.33 |
| vii | තේ සැකසුම් තාක්ෂණය | 2.17 | 7.56 | 72.81 | 96.30 |
| viii | සැකසූ තේ ගුණාත්මක තත්ත්වය | 0.74 | 1.83 | 6.76 | 45.36 |
| ix | අගය එකතුකළ තේ නිෂ්පාදන | 5.97 | 3.65 | 58.29 | 41.64 |
| x | සම්පත් සැලසුම්කරණය | 0.44 | 3.00 | 29.55 | 71.67 |

| | | | | | |
|---|---|---|---|---|---|
| xi | පර්යේෂණාත්මක විදේශ සේවා වැඩි දියුණු කිරීම. | 0.02 | 0.72 | 50.00 | 04.17 |
| xii | තාක්ෂණය ව්‍යාප්ත කිරීම. | 2.28 | 11.46 | 35.09 | 88.39 |
| xiii | සාන්ද්‍රික ප්‍රජාව සඳහා සේවා | 2.16 | 15.18 | 64.81 | 76.61 |
| xiv | පර්යේෂණ කළමනාකරණය | 7.34 | 14.80 | 70.44 | 125.88 |
| xv | අභ්‍යන්තර සේවා සහ නඩත්තුව | 30.81 | 181.35 | 67.22 | 102.97 |
| | එකතුව | 80.00 | 291.00 | 64.76 | 100.30 |

(ආ) කුඩා තේවතු හිමිකරුවන් අතර තේ එලදාව පිළිබඳ හා කප්පාදු කිරීමේ යන්ත්‍ර පිළිබඳ ප්‍රචලිත කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර මෙම කාර්යය සඳහා රජය විසින් රු.මිලියන 100 ක මුදලක් අනුමත කර තිබුණි. අමාත්‍යාංශයේ මහ පෙන්වීම යටතේ කුඩා තේවතු සංවර්ධන අධිකාරිය, කුඩා තේවතු හිමිකරුවන්ගේ සංගමය පුද්ගලික තේ කම්හල් අයිතිකරුවන්ගේ සංගමය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ ඒකාබද්ධව මණ්ඩලය විසින් මෙය ආරම්භ කරන ලදී. 2013 වර්ෂයේ අග භාගයේ දී රු.මිලියන 20 ක ආරම්භක වෙන්කිරීම ලැබී තිබූ අතර ඉන් රු.මිලියන 2.5 ක් පමණක් මෙම වැඩසටහන සඳහා උපයෝජනය කර තිබුණි.

## 4.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාන්ත ජෝකිම් වතුයායේ හෙක්ටයාර් 143.810 ක් වූ මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 17.675 ක් දීර්ඝ කාලයක සිට බාහිර පාර්ශවයන් විසින් අල්ලා ගෙන තිබූ අතර එහි ස්ථිර නිවාස ඉදිකර, වී, තේ, පොල් හා වෙනත් භෝග ආදිය වගාකර තිබුණි. එබැවින් එම අල්ලාගත් ඉඩම් වලින් වතුයායේ ආදායම අහිමි වී තිබූ අතර එම ඉඩම් ආපසු අත් කර ගැනීමට 2014 මාර්තු 31 දක්වා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

හෙක්ටයාර් 17.675 කින් හෙක්ටයාර් 8.74 ක් වූ කුඹුරු ඉඩම්, 1963 වර්ෂයේ ශාන්ත ජෝකිම් වතුයාය තේ පර්යේෂණ ආයතනයට අත්පත් කර ගැනීමට පෙර වගා බදුකරුවන් 35 දෙනෙකුට ලබා දී තිබූ බවත්, ඉතිරි ඉඩම් ප්‍රමාණය බලෙන් අල්ලාගෙන ඇති බවත්, රත්නපුර ගොවි ජනසේවා මධ්‍යස්ථානය මඟින් බදු වගාවේ ඉඩම් අයිතිකරුගේ කොටස ලබා ගැනීමට වතුයාය කටයුතු කර ඇති බවත්, ඉඩම් අල්ලා ගත් අයට එරෙහිව වතුයාය කටයුතු කර ඇති බවත්, එම අල්ලා ගැනීම් වර්ෂ 25 කට පෙර සිදුවී ඇති බවත් 2014 සැප්තැම්බර් 01 දින මණ්ඩලයේ සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) නිල නිවාස 165 කින් 38 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට වර්ෂ 05 කට වැඩි කාලයක් නිෂ්කාර්යව තිබූ බව විගණනයට නිරීක්ෂණය විය.

## 4.3 අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තේ පර්යේෂණ ආයතනයේ කම්කරුවන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා 2013 ඔක්තෝබර් මාසයේ දී මහා භාණ්ඩාගාරය විසින් රු.6,000,000 ක මුදලක් ලබාදී තිබුණද, වැඩසටහනට අදාළ කාර්යයන් 2014 අප්‍රේල් 23, විගණන පරීක්ෂණ දිනය වන විටත් ආරම්භ කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට මෙම වැඩසටහනේ කෙරීගෙන යන

වැඩ යටතේ රු.261,680 ක මුදලක් පමණක් උපදේශක සේවා හා ප්‍රචාරණ වියදම් ලෙස ඇතුළත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම අනුව, භාණ්ඩාගාරය විසින් රු.9,321,000 ක් අරමුදල් සපයා තිබුණද, සැලැස්මට අනුව දෙණියාය ' සී ' වර්ගයේ නිල නිවාස ඉදිකිරීම, කොට්ටාවෙහි කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම, යුගල නිල නිවාස ඉදිකිරීම ,තලවාකැලේ වැසිකිළි ඉදිකිරීම හා පස්සර ජල සැපයුම් සිදුකිරීම යන කාර්යයන් 2014 මැයි 31 විගණන දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.4 ව්‍යාපෘති කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 සිට 2008 දක්වා කාලපරිච්ඡේදය තුළ පාංශු පර්යේෂණ කාර්යයන් සඳහා මෙතිල් බ්‍රොමයිඩ් ව්‍යාපෘතියෙන් (Methyl Bromide Project) ලැබුණු රු.9,608,720 ක් වූ අරමුදල් වලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.8,179,693 ක මුදලක් පමණක් වැය කර තිබුණි. එබැවින් ව්‍යාපෘති ගිවිසුමට අනුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2010 මාර්තු 30 දිනට ඉකුත් වී තිබුණද, රු.1,429,059 ක මුදලක් වැය කර නොතිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) තේ කම්හල් අධ්‍යයනය පිළිබඳ ව්‍යාපෘතිය යටතේ රු.187,452 ක මුදලක් ඉතිරිවී තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත හා සත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 443 ක් හා 236 ක් විය.නියෝජ්‍ය අධ්‍යක්ෂවරු 4 දෙනෙකු, අංශ ප්‍රධානින් 05 දෙනෙකු හා ප්‍රධාන පර්යේෂණ නිලධාරින් 14 දෙනෙකු ඇතුළත් පුරප්පාඩු 207 ක් තිබූ අතර මෙම පුරප්පාඩු පිරවීමට මණ්ඩලය විසින් 2011 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි.

(ආ) ශාන්ත කූම්බ්ස් වතුයායේ හා ශාන්ත ජෝකිම් වතුයායේ අනුමත හා සත්‍ය සේවක සංඛ්‍යාව අතුරින් සමූහ ගිවිසුම යටතේ වැඩකරන සේවකයන් පිළිවෙලින් 42 ක් හා 31 ක් විය.

(ඇ) භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ප්‍රධාන නිලධාරීන් 06 දෙනෙකුට මසකට රු.3000 බැගින් දීමනාවක් ගෙවා තිබුණි. මණ්ඩලයේ ප්‍රධාන නිලධාරී තනතුර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර නොතිබූ බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) අධ්‍යක්ෂට, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය භාර නිලධාරීන්ට ඔවුන්ගේ නිල නිවාස නඩත්තු කිරීම වෙනුවෙන් මාසික කම්කරු දීමනාවක් ප්‍රතිපූර්ණය කිරීමට 2007 මැයි 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. කෙසේ වුවද නිෂ්පාදන ප්‍රසාද දීමනා, අතිකාල, පැමිණීමේ ප්‍රසාද දීමනා ආදිය ඇතුළත් කම්කරු වේතන පදනම් කරගෙන මෙම දීමනාව ගණනය කර තිබූ අතර, රේඛීය අමාත්‍යාංශය හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මණ්ඩලය විසින් වර්ෂය තුළදී එකතුව රු.2,717,945 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. අමාත්‍යාංශයෙන් හා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොදෙන්නේ නම් 2015 ජනවාරි 01

දින සිට මෙම ගෙවීම නතර කරන බව මණ්ඩලයේ සභාපති විසින් 2014 සැප්තැම්බර් 01 දින මා වෙත දන්වා තිබුණි.

(ඉ) වෙනත් සමාන පර්යේෂණ ආයතනවල කාර්ය මණ්ඩලවලට නොලැබෙන 1995 පරිපාලන පටිපාටි සංග්‍රහය ප්‍රකාරව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පහත සඳහන් වරප්‍රසාද ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

(i)

| නිවාඩු | අනියම් | විවේක | වෛද්‍ය | එකතුව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය | 11 | 22 | 30 | 63 |
| කණිෂ්ඨ ශ්‍රේණිය | $05_{1/2}$ | 22 | 30 | $57_{1/2}$ |
| සුළු සේවක ශ්‍රේණි | $05_{1/2}$ | $16_{1/2}$ | 30 | 52 |

(ii) තලවාකැලේ හා උපමධ්‍යස්ථානවල නිලනිවාසවල පදිංචි සේවකයන් සඳහා විදුලිබල කෝටාව (quota)

| | | | |
|---|---|---|---|
| I | ශ්‍රේණිය | ඒකක | 300 |
| II | ශ්‍රේණිය | ඒකක | 225 |
| III - V | ශ්‍රේණිය | ඒකක | 150 |
| VI | ශ්‍රේණිය | ඒකක | 100 |

සමාන ආයතනයන් සඳහා අදාළවන වර්තමාන රීති හා රෙගුලාසිවලට ගැලපෙන ලෙස මණ්ඩලයේ පරිපාලන පරිපාටි සංග්‍රහය විධිමත් කිරීමට පියවර ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන්, අවශ්‍ය සංශෝධන / නිවැරදි කිරීම් සඳහා පවත්නා චක්‍රලේඛවලට අනුව තේ පර්යේෂණ ආයතන අත්පොත සංශෝධනය කිරීමට කමිටුවක් පත්කිරීම සඳහා දැනටමත් මණ්ඩලය විසින් පියවර ගෙන ඇති බව 2014 සැප්තැම්බර් 01 දින මණ්ඩලයේ සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

(ඊ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගෙන අනිවාර්ය සේවා කාල පරිච්ඡේදය සේවය කිරීමට නොහැකි වූ නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.27,090,600 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. එම නිලධාරීන්ට අදාළ පාරිතෝෂික ප්‍රතිපාදන තුළ ඔවුන් සේවය කළ කාල පරිච්ඡේදය සඳහා රු.1,031,668 ක මුදලක් ඇතුළත්ව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) ශාන්ත ජෝකිම් වතුයායේ සේවය කරමින් සිටි සේවකයන් දෙදෙනෙකු සඳහා උසස්වීමක් හා ස්ථිර තත්ත්වය ලබා දීම සම්බන්ධයෙන් 2008 ජුනි 26 දින විශේෂ ගැසට් නිවේදනයෙහි ප්‍රසිද්ධ කරන ලද කම්කරු උසාවි තීන්දුව ක්‍රියාත්මක කිරීම නොසලකා හැරීම පිළිබඳව 2008 වර්ෂයේදී මණ්ඩලයට එරෙහිව කම්කරු කොමසාරිස්වරයා විසින් අධිකරණ නඩුවක් ගොනුකර තිබුණි. මුල් අවස්ථාවලදී විසඳුමකට පැමිණීමෙන් තොරව මණ්ඩලය විසින් නඩුව ඉදිරියට ගෙන ගොස් තිබූ බවත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.902,000 ක මුදලක් පුද්ගලික නීතිඥවරුන්ට ගෙවා තිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේවුවද 2013 පෙබරවාරි මාසයේදී මණ්ඩලය විසින් නඩුව ඉවත් කරගෙන තිබූ අතර එම සේවකයන්ට වැටුප් වර්ධක හිඟ මුදල් ලෙස 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.110,393 ක් හා රු.73,676 ක් ගෙවා තිබුණි.

**4.6 මෝටර් වාහන උපයෝජනය**

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 07 කදී මණ්ඩලයට අයත් වාහන 06 ක් අනතුරුවලට භාජනය වී තිබුණි. කෙසේවුවද, මුදල් රෙගුලාසි 104(2) ,(3),(4) ප්‍රකාරව මේ පිළිබඳ විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබූ අතර අලුත්වැඩියා පිරිවැය, රක්ෂක විසින් කරන ලද ප්‍රතිපූර්ණයන් රු.76,240 කින් ඉක්මවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියාපදිංචි කරන ලද මෝටර් වාහන 06 ක් මණ්ඩලය යටතේ ලියාපදිංචි කිරීමෙන් තොරව මණ්ඩලය විසින් උපයෝජනය කර තිබුණි.

**5. අයවැය පාලනය**

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) අත්තිකාරම් ගෙවීම හා නිරවුල් කිරීම.
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ලැබිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල්
(ඉ) කම්හල් කළමනාකරණය